# MONEY, BANKS & PRICE LEVELS (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# <u>මුදල් ඉල්ලුම</u>

කිසියම් අවස්ථාවක දී මුදල්, මුදල් වශයෙන් ළඟ තබා ගැනීමට මහජනතාව තුළ ඇති කැමැත්ත මුදල් ඉල්ලුම (ද්‍රවශීලතාවරණය) යනුවෙන් හැඳින්වේ.

# <u>මුදල් ඉල්ලුමට හේතු</u>

මුදලට ඉල්ලුමක් ඇති වීම කෙරෙහි බලපාන ප්‍රධාන හේතු තුනකි.

- ගනුදෙනු චේතනාව
- ආරක්ෂණ චේතනාව
- සමපේක්ෂණ චේතනාව

ClassWork.LK

# ගනුදෙනු චේතනාව නිසා ඇති වන මුදල් ඉල්ලුම


පුද්ගලයාට ලැබෙන ආදායම් සහ පුද්ගලයා කරන වියදම් එකිනෙකට නොගැළපීම නිසා එදිනෙදා ගනුදෙනු කිරීමේ අරමුණෙන් මුදල් ශේෂ ළඟ තබා ගැනීම ගනුදෙනු චේතනාව නිසා ඇති වන මුදල් ඉල්ලුම ලෙස හැඳින්වේ.

ආදායම් උපයන කාලයත් වියදම් සිදු කරන කාලයත් අතර කාල පරාසයක් පවතින අතර එම කාල පරාසය තුළ සුමට ලෙස ඇති වන ගනුදෙනු සිදු කිරීම සඳහා මුදල් ශේෂ ළඟ තබා ගත යුතු ය.

ගනුදෙනු චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම තීරණය කරන ප්‍රධාන සාධකයවන්නේ පුද්ගලයන්ගේ ආදායමයි.

ClassWork.LK

ගනුදෙනු චේතනාවෙන් මුදලට කරන ඉල්ලුමත් ආදායමත් අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී. එය පහත සඳහන් පරිදි ප්‍රස්තාර සටහනක් මගින් දැක්විය හැකි ය.




ඉහත ප්‍රස්තාර සටහනට අනුව පුද්ගලයාගේ ආදායම වැඩි වන විට එදිනෙදා ගනුදෙනු සඳහා වැඩි මුදල් ප්‍රමාණයක් ළඟ තබා ගැනීමට පෙළඹේ. ආදායම අඩු වන විට එදිනෙදා ගනුදෙනු සඳහා අඩු මුදල් ප්‍රමාණයක් තබා ගැනීමට පෙලඹේ.

ආදායමට අමතර ව ගනුදෙනු චේතනාව සඳහා මදලට ඇති වන ඉල්ලුම කෙරෙහි පොළී අනුපාතිකය, මිල මට්ටම, මූල්‍ය වෙළෙඳපොළ නව්‍යතා හා ආයතනික සාධක ද බලපායි.

ClassWork.LK

# <u>ආරක්ෂක චේතනාව නිසා මුදලට ඇති ඉල්ලුම</u>


සැලසුම් කළ නොහැකි අනපේක්ෂිත ව ඇති වන වියදම් කාර්යක්ෂම ව පියවා ගැනීමේ අරමුණෙන් පුද්ගලයන් මුදල් ශේෂ ලඟ තබා ගැනීම ආරක්ෂක චේතනාව නිසා මුදලට ඇති ඉල්ලුම ලෙස හැඳින්වේ.

**නිදසුන් :**

හදිසි අනතුරු, ලෙඩ රෝග වැනි අවස්ථාවල දී ප්‍රයෝජනයට ගැනීම සඳහා මුදල් ශේෂ ළඟ තබා ගැනීමයි.

ClassWork.LK

ආරක්ෂණ චේතනාව නිසා මුදලට ඇති වන ඉල්ලුමත් ආදායමත් අතර අනුලෝම සම්බන්ධතාවක් පවතින අතර එය පහත ප්‍රස්තාරයෙන් දැක්වේ.




$MD_p = f(Y)$ ආරක්ෂණ චේතනාවෙන් මුදලට ඇති වන ඉල්ලුම

(Y) = ආදායම

ඉහත ප්‍රස්තාර සටහනට අනුව පුද්ගලයන්ගේ ආදායම වැඩි වන විට ආරක්ෂණ අරමුණ මත වැඩි මුදල් ප්‍රමාණයක් ළඟ තබා ගැනීමට පෙලඹෙන අතර ආදායම අඩු වන විට ආරක්ෂණ අරමුණ මත අඩු මුදල් ප්‍රමාණයක් ළඟ තබා ගැනීමට පෙලඹේ.

ClassWork.LK


# <u>සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම</u>

පිළිණපත්වල මුදල් ආයෝජනය කිරිමෙන් අනාගත වාසි (ප්‍රතිලාභ) ලබා ගැනීමේ අරමුණෙන් මුදල් ළඟ තබා ගැනීම සමපේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම යි. නැති නම් වත්කමක් ලෙස මුදල් ශේෂ ළඟ තබා ගැනීම සමපේක්ෂණ මුදල් ඉල්ලුම වේ.

ජනතාව විවිධ වත්කම් ළඟ තබා ගැනීමට පෙලඹෙන අතර සිය වත්කම් ගොනුවේ මුදල් හා පිළිණපත් අතර තේරීම් කිරිම පොළී අනුපාතිකය අනුව සිදු වේ.

ClassWork.LK

මේ අනුව පොළී අනුපාතිකය හා වත්කමක් ලෙස මුදල් ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් ඇති වේ. එම ප්‍රතිලෝම සම්බන්ධතාව පහත රූප සටහන මගින් පැහැදිලි වේ.




ඉහත රූපයේ දැක්වෙන පරිදි පොළී අනුපාතිකය ඉහළ යන විට සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම අඩු වේ. පොළී අනුපාතිකය පහළ යන විට සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම වැඩි වේ.

පොලී අනුපාතිකය හා පිළිණපත්වල මිල අතර පවතිනුයේ ප්‍රතිලෝම සම්බන්ධතාවකි. එනම් පොලී අනුපාතිකය ඉහළ යන විට පිළිණපත්වල මිල පහළ යන අතර පොලී අනුපාතිකය පහළ යන විට පිළිණපත්වල මිල ඉහළ යයි.

සත්‍ය වශයෙන් වර්තමානයේ පොලී අනුපාතිකය අඩු නම් පිළිණපත්වල මිල ඉහළ මට්ටමක පවතී. නමුත් අනාගතයේ දී පොලී අනුපාතිකය ඉහළ යතැයි සහ ඊට ප්‍රතිලෝම ව පිළිණපත්වල මිල පහළ යතැයි ජනතාව තුළ අපේක්ෂණයක් ඇති වේ.

මේ නිසා ජනතාව පිළිණපත් මිල දී ගැනීමට පෙළඹෙන හෙයින් පොලී අනුපාතිකය ඉහළ යන විට සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම අඩු වේ.

අනාගතයේ දී පොලී අනුපාතිකය පහළ යතැයි සහ ඊට ප්‍රතිලෝම ව පිළිණපත්වල වෙළෙඳපොළ මිල ඉහළ යතැයි ජනතාව තුළ අපේක්ෂණයක් ඇති වුවහොත් ජනතාව පිළිණපත් විකිණීමට පෙලඹේ.
(ඉහත රූප සටහනෙහි b ලක්ෂ්‍යයෙහි දැක්වෙන පරිදි)

මේ නිසා පොලී අනුපාතිකය පහළ යත් ම සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇත ඉල්ලුම වැඩි වේ.

ClassWork.LK

# මුදලට ඇති ඉල්ලුම තීරණය වීම කෙරෙහි බලපාන සාධක

- මූර්ත ආදායම
- පොළී අනුපාතිකය
- මිල මට්ටම
- අනාගත අපේක්ෂණ
- ආයතනික සාධක
- මූල්‍ය වෙළෙඳපොළ නව්‍යතා

## මූර්ත ආදායම

මූර්ත ආදායම හා මුදල් ඉල්ලුම අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී. එනම් මූර්ත ආදායම ඉහළ යන විට මුදල් ඉල්ලුම ඉහළ යයි.

## පොළී අනුපාතිකය

පොළී අනුපාතිකය හා මුදල් ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් පවතී.

එනම් පොළී අනුපාතිකය ඉහළ යන විට මුදල් ඉල්ලුම් ප්‍රමාණය අඩු වේ.

ClassWork.LK

## මිල මට්ටම

මිල මට්ටම ඉහළ යන විට මුදල් ඉල්ලුම ද ඉහළ යයි.

## අනාගත අපේක්ෂණ

අනාගතයේ දී උද්ධමන අනුපාතිකය ඉහළ යතැයි අපේක්ෂා කරන විට වර්තමානයේ භාණ්ඩ හා සේවා මිල දී ගැනීමට පෙලඹෙන බැවින් ළඟ තබා ගන්නා මුදල් ප්‍රමාණය වැඩි වේ.

පිළිණපත්වල මිල අනාගතයේ වැඩි වෙතැයි අපේක්ෂා කරන විට වර්තමානයේ පිළිණපත් මිල දී ගැනීම පෙලඹෙන බැවින් ළඟ තබා ගන්නා මුදල් ශේෂ අඩු වේ.

## ආයතනික සාධක

ඳආයතනික සාධක යනුවෙන් අදහස් කරන්නේ ආදායම් ලැබෙන වාර දෙකක් අතර කාල පරතරයි. අවම කාල පරතරයක් තුළ ආදායම් ලැබෙන විට මුදල් ඉල්ලුම පහළ යයි. මුදල් ලැබෙන කාල පරතරයන් දීර්ඝ වන විට ළඟ තබා ගන්නා මුදල් ප්‍රමාණය ඉහළ යයි.

Class Work.LK

# මූල්‍ය වෙළෙඳපොළ නව්‍යතා

මූල්‍ය වෙළෙඳපොළ නව්‍යතා වැඩි දියුණු වන විට මුදල් ළඟ තබා ගන්නා ප්‍රමාණය පහළ යයි.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura